තවද සිතක් හඳුනා ගැනීමට නම් එහිලා * සිත හටගන්නේ කෙසේද ? * සිත උපදින්නේ කොතනින්ද ? * සිතක ආයුෂ කොපමණද ? යන මේ කරුණුද දැනගතයුතුය. (විස්තර සඳහා මේ සමග ඇති දේශනාවට සවන් දෙන්න.)

- අරමුණු හේතුකොට ගෙන සිත් ඇතිවේ. අතීත සිතෙහි ප්‍රත්‍ය ශක්තිය (අනන්තර/සමනන්තර/නිස්සය/උපනිස්සය/නිශ්‍රය ආදී) ද උපකාර වෙති.
- ඇස ආදී ඉන්ද්‍රි ධර්ම 5 සහ වස්තු රූපය තුලින් සිත් උපදී සියල්ල 6කි. ඒවා ද්වාර හෙවත් වස්තු ලෙසද දක්වයි.
- උපදින ඇසුරුකරන ස්ථානය අනුව සිතට නම් යෙදේ. (* චක්ඛු විඤ්ඤාණය/සෝත විඤ්ඤාණය * චුති/ ප්‍රතිසංධි .....ආදීලෙස)

<u>සිතක ආයුෂ-</u>

සිතක් යනු එකක් නොව ඉතා කුඩා කුඩා ක්ෂණ ගණනාවක එකතුවකි. සිත් වැලකි. යටත් පිරිසයෙන් ක්ෂණ 17 ක එකතුව සිත්වැලකි. එනම් චිත්ත වීථියකි.

සිතක ආයුෂ කීමට කිසිදු ඒකකයක් නැත එය ඒතරම් සියුම්ය කුඩාය ඊට වඩා කුඩා කිසිවක් නොමැත. එය අවබෝධ කරගත් තථාගත සම්බුදු පියානන් වහන්සේ සිතේ ආයුෂ කියන ඒකකය චිත්තක්ෂණය ලෙස දැක්වීය.

එම කුඩා ඒකකයේද කුඩා ක්ෂණ 3කි. එනම් උප්පාද ඨිති භංග (ඇතිවීම/පැවතීම/නැතිවීම) ලෙසිනි. චිත්තක්ෂනයක් සම්බන්දව බලනවිට මේ එක එකක් සමානවූ කාල පරාසයෝය. එවන් කුඩා ක්ෂණ 3ක් (උ.ඨි.භං) චිත්තක්ෂණ (මහා ක්ෂණ) 1කි. මහා ක්ෂණ 17ක් චිත්ත වීථි 1කි. සහ රූපකලාපයකි ආයුෂය.

| | |
|---|---|
| චිත්තවීථියක් යනු | චිත්තක්ෂණ 17කි |
| | කුඩා ක්ෂණ 51කි |
| | රූපකලාපයක ආයු ප්‍රමාණයකි |

ස්වරූපය අනුව සිත් බෙදනවිට කොටස් 4ක් බව ඉහත කියනලදී එනම් - අකුසල/ කුසල /විපාක /ක්‍රියා ලෙසිනි.

සිතක් අකුසල යයි පවසන්නේ ඇයි ? * අකුසල මූලයෝ යෙදී තිබීම. * මානසිකව දුබල වීම * නිග්‍රහ සහගත බව * දුක් විපාක සහිතබව

සිතක් කුසල වන්නේ කෙසේද ? * අලෝබ අද්වේෂ අමෝහ යන කුසල මූලයන් 2ක් හෝ 3ක් යෙදී තිබීම. එවිට සිත නිරෝගීය. අනවජ්ජය. සුඛවිපාක සහගතය.